Page 9 April 2013.qxd 15/05/2013 19:09 Page 1



## ලංකාවිත්ති

ලංකා වක විත්ති දස දියතෙහි රන්දා
ලංකා වට එරෙහි රුපු සෙන් ඔද බින්දා
ලංකා වෙන් පැමිණි හෙළයන් රස වින්දා
ලංකා විත්ති නොමැතිව හෙට පුලු වන්දා

රණ විරුවන් වෙතින් වුණු සේවය නිබඳ
රණ ගී පතුරමින් නිති තුටුවුණු සුහද
රණ බිම අසිපතක් ලෙස බස යෙදු සබඳ
රණ සිංහයෙකි ඔබ ලන්ඩන් මහ කිවිඳ

ල න් ඩ න් නුවර සාහිතඹර නිති දිලුණ
වැ ස් ස න් සිහළකම හා නිතැතින් වෙලුණ
ම න් ස න් තොස් සැදූ ඔබ හෙට නැති බැවින
ගොම්මන් අඳුර එනු ඇත හද කර මිලින

හිමය කටුක සීතල දුක් නොත කාම
සමය දැයද රට සමගින් විම සාම
බසය ඔබෙන් සැදුණේ නෙත් නොව සාම
කිමය යහලු යන්නේ අද නොකි යාම ?

හඩ වා සිහළ සාහිත රසු නව නැම්මේ
හඩ කෝ නෙත් සොයයි විත්තිය නැත නිම්මේ
හඩ නා දෙනෙත් හදවත දුක පිරි පෙම්මේ
හඩ නු එපා! ඔබ මගෙ සිරි ලක් අම්මේ !

♦ **නීතිඥ අනුර හෑගොඩ** London

## හද බැඳගත්ති - ලංකාවිත්ති

නොමින් වසර දහසය නොසැලී දිගට
නැණින් සුවඳ පතුරා ලොව දස අතට
නි ති න් උතුම් දෙස බස රැකගත් පිනට
ඉ ති න් සිහළ ජාතිය ණයගැති නුඹට !

සාහිත කවි කතා රට තොට හා බැඳුණ
සීමිත වුවත් ඉඩකඩ නිසි ලෙස පිරුණ
මාවත රළු නමුදු අත් නොහැරම රැඳුණ
මීවිත ලෙසින් දකිනෙමු නැණ ගුණ වරුණ !

රූසිරි සපිරි නැවණැස දැල්වූ ඇත්තී
පැසිරි පියෙන් පිය නැග දියුණුව දත්තී
සීගිරි කවක රසයෙන් හද බැඳ ගත්තී
ආසිරි පතමි ඔබ හට ලංකා විත්තී !

♦ **පද්මා කුරුප්පු** Paris, France

## හෙළ අවුරුදු !

සි ටි යත් පර දෙසක ඉරණම් දොරටු ඇරී
මැරුණත් උපන් රට අමතක කරනු බැරී
හ ද ව ත් තුළ මවාගෙන පින් කෙතක සිරී
ක ව ද ත් දෙනෙත් ඇත ලක්බිම දෙසට හැරී

පෙර සිට නොකඩවා වත් පිළිවෙත් සුරැකී
සිංහළ අවුරුද්ද ආසිරි වාද යකී
කිසි දින කොයි ලෙසින් හෝ නොම යන වියැකී
සුන්දර ළමා දිවියේ එක් මතකය කී

තුටුවුණි පැද්දි පැද්දී වැල් ඔන්චිල්ලේ
ඇසුවෙමු සුරල් මී අඹ ගස් සෙවනැල්ලේ
එක් වෙනු බැරි වුනත් ඒ ලෙස සැනසිල්ලේ
සමරමු සිතින් හෙළ අවුරුදු මංගල්ලේ

මසවුළු නැතත් නිදහස නැබ පිරී ඇත
එරබදු ගහෙත් සාමයෙ මල් පිපී ඇත
සම්බුදු ගුණ බලෙන් දැය පණ පෙවී ඇත
මේ බඳු සිතුවිලින් සිත සැනසිලා යත

ඇති හැකි ලෙසින් නෑ සිය මිතු සලකන් නේ
නැති බැරිකම ද ඒ විලසිනි පරදන් නේ
එකමුතුකමය අප හැම දෙන රැක දෙන් නේ
ඒකයි අළුත් අවුරුද්දෙන් කියැවෙන් නේ

ගිළිහෙන හෙළ සිරිත් මතකයෙ රඳ වන්න
පෙර මෙන් රසික හදවත් නිති පින වන්න
පැතුමක් තිබේ නව වසරෙත් ඉටු වෙන්න
ලංකාවිත්ති නොනැවත පෙරටම යන්න !

♦ ***Dr* ශ්‍රියා කුමාරසිංහ** New Zealand

## ලංකාවිත්ති දිනේවා!

පිරිසක් නිසා හිත ඇති සිංහල බසට
ලන්ඩන් නුවර මෙතුවක් තිබු අඩුව කට
සිංහල සිත්සතන් නිසි ලෙස පුබුදු කොට
ලංකා විත්ති ආ හැටි අප පෙර මුණට

හෙළ උරුමයේ එඩිතරකම පෙන්නාදී
පරගැතිබවේ නිවටුන් වෙන්නටත් නොදී
උපන්බිම කොරෙහි යුතුකම් පහදා දී
ලංකාවිත්ති පළවෙයි ලන්ඩන යේදී

ලංකාවිත්ති සේවය හරි අගේය
කළු සුද්දන්ගෙ ඇසි ටික ටික ඇරේය
මසකින් මසට නව නිමැවුම් බොහෝය
රට දැය හිතැති හැම දෙන එහි වටේය

♦ **සරත් සිල්වා** Manor Park London E12

## දහසය වෙනි මහුල්ගෙදර

රන් අකුරකින් මහවංසයෙ පොතක ලියා
පින් දී ලක්මවට බිව් කිරි මතක තියා
හැං ගී නොසිට පිටරට විත් නොමග නොයා
ල ං කා විත්තියෙන් ජයහඬ නැගුව දයා

ලොව ටම පියැඹුව ලක්මව පුබුදු කොට
ඒ ව තොත් යමක් සංවත්සර උළෙල කට
අ ව සන් පත්තරය මේකයි පැවසු විට
නැ ව තුනි මගේ කවි හිත ගිනි අඟුරු පිට

ඉවර වෙලා කොටිහඬ තැවුල දුක ගෙනා
නතර වුණා තිබු බිය තුටිනි හැම දෙනා
උතුර බෙදන තැත ගත් එවුන් පැර දුණා
අමර ණීය සේවය ඔබෙන් ඉටු වුණා

කොට සක් කඩාගන්නට හැදූ කොටි නඩය
ය ට කොට ඉන්න විට දිගහැර මුතු කුඩය
ව ට කර නසා සිරිලංකා සතු හැඩය
ර ට රටවල තවත් පැතිරෙන කොටි හඬය

රට ගම අතැර විත් හිතකින් සුරක් සිත
මව් බිම මතක් වී වැලපෙන කෙනෙක් නැත
තමතම වැඩ කරති බියගුළු හිතක් මත
යුද බිම ගැන මතක ඔබටත් මටත් ඇත

නි ත රම යුද බිමට ලිව් පැදි පෙළෙන් තම
අ ත හිත දුන්නු හැටි කිවිඳුන් තලන් ගම
සෙත පැතු අයුරු දෙවියන් වැඳ බලෙන් එම
සි ත පණ පෙවූ රණවිරුවන් සටන් බිම

ද ත් සිඳ මරා දී කොටිනගෙ මළ දානේ
සෙත් පැතු සිරිලකට හඬකින් කවි රැණේ
ප ත් තරයකින් පෑ ජාතක අබි මානේ
උ ත් තම පත්තරේ මේකද අව සානේ

පෙම කින් රටට සරසවි ගෙන තුරුල් ලට
නි ම නැති සතුටකින් කවිපද සුරල් පිට
හැ ම රටකම සිටින කවිකුල හවුල් කොට
ම ම සුබ පතමි දහසය වෙනි මගුල් ගෙට

ආ යුද බලේකින් උතුරේ වනන් තරේ
මාලිග හදාගෙන වැඩිකොට බවුන් ඩරේ
දී හ ඩ පෙලපාලි ගෙනයන සැරින් සැරේ
මේකද ඩයස්පෝරාවෙත් කතන් දරේ

♦ **කිවිපති පාතකඩ කුලතිලක**
Ashford Kent UK

## ආසිරි පතමු !

ලන්ඩන් වලට විත්
වැඩිදුර ඉගෙනුම ට
සිංහල පොත පතක්
පත්තරයක් ඇහැට
නොදකින වෙලාවේ
ආ අප දොර කඩට
ලංකා විත්ති මීපැණි
ගුලියකි අපට

නොවරදවාම හිනැහී
රස විඳ ගන්න
පොඩි පොඩි ආරංචි
තොරතුරු දැන ගන්න
මොනවද අප රටේ
වැදගත් කිය වන්න
නැහැ වැරදුවේ
ලංකා විත්තිය ගන්න

රස කල්පනා ලැදි
කවියට කලා වට
කාටත් අත දෙමින්
දියුණුව දැකී මට
ලංකා විත්ති අත හිත
දෙයි හැබෑ වට
ආසිරි පතමු දහසය
වස් උදා වට

♦ **රවී රූපසිංහ**
නුගේගොඩ Sri Lanka

## සිංහල අවුරුදු සිරි

අවුරුදු එනවලු - ළඟ ළඟ එනවලු
ගම්මානේ කලඑළි වන්නේ
කොවුල් ගීත නද පැතිරෙන ගානට
එරමුදු යායම හිනැහෙන්නේ

කැවුම් කොකිස් අතිරස මුං අග්ගල
සුවඳයි සැම තැන පැතිරෙන්නේ
ඔංචිලි වාරම් රබන් සුරල් හඬ
ගම්මානෙට නව පණ දෙන්නේ

ඉස්සර වාගේ අවුරුදු කොයිබද
කොනකින් මැසිවිලි ඇයි එන්නේ
කොහේ නැතත් ඒ අවුරුදු අසිරිය
මගේ හිතේ නෑ මියයන්නේ !

♦ **ශ්‍රීපාලි කොටුවැල්ල**
Ca, USA



## සමුගන්නා ලංකා විත්ති කුමරියට !

දුර රටක හිඳ උපන් මව්බිම වැදු මවට සම කළා වේ
මුල්ම පිටුවේ ඉහල කොටසේ එවදනින් සැරසුනා වේ
එතෙර අප හට එය කියන්නට ලංකාවිත්තිය ගෙනා වේ
හිතාදර කතුතුමණි ඔබහට අපගේ පැසසුම් වුනා වේ!

උපන්බිම ගැන සිටන් දුරුරට හසුරුවන පන්හිඳක මහි මය
හරබරින් යුතු වුනේ කැටිකොට ජාතිකාලය අපේකම මය
නොයෙක් බාදක කම්කටොළු මැද
අඛණ්ඩව ගිය ගමනකිය මෙය
ඔබේ ඔවදන වුනේ සැමදින මව් රටේ අයිතිය රැකී මය

රුදුරු යුදගිනි ඇවිලි මව්බිම පෙලුණ සෙනසුරු දසාවේ
දිරිය දෙන්නට රණ විරුන්හට ඇරඹුවා කවි කලාවේ
ඇමිණු කවිවැල් සුබපැතුම් සෙත් ලංකවිත්තිය ගෙනාවේ
රට රකින විරුවන් කියෙව්වා මේ කවිත් මහ කැලැවේ

මුදල් පසුපස හඹා යන මේ සමාජෙට අරුතක් සදා
සොලොස් වසරක් පුරාවට දුන් වගයි මෙය නොමිලේ බෙදා
මහඟු මෙහෙවර නිමාකොට අද සමුඅරන් යන මුත් මෙදා
දෙස් විදෙස් වල ලංකාවිත්තියෙ නොමියනා නම ඇත සදා

වසර ගණනත් අපද සමගින් ගිය මගේ මල් පිපේවා
සැදූ මෙහෙවර අගය කරනෙමු ඔබේ ගුණ ගී ගැයේවා
සිතේ පැතුමන් සඵල වී ඔබෙ යහමගේ දොර ඇරේවා
කතුතුමනි, ආනන්ද මැතිඳුණි, ඔබ දිගා කල් දිනේවා!

♦ **ඇඹිලිපිටියේ, විමලා යාපා** Cyprus

## ලංකාවිත්තියට සෙත් පතමි!

සිටිනා සියළු දෙන දස අත රටින් රට
දෙයි රස මිහිරි තොරතුරු ලක්විත්ති යට
මෙපමණ කලක් කළ සේවය අගේ කොට
පතනෙමු දිගාසිරි කතුවර දයාට

හෙළ බස් හසුරුවා නිසි පියකරු ලෙසට
සේවය අගෙයි කරනා ලන්ඩන් වලට
ඔබ පින් කඳකි යුතුකම් දන්නා යසට
තුති පුද දෙමු නමමු අපි හිස ඔබ නමට

ඔබ වැනි පුතෙකු බිහි කළ මව පින්වත් ය
දෙස බස රකින්නට අදිටන වැදගත් ය
දක්වන ඇල්ම උත්සාහය ඉමහත් ය
ඔබ සහ පුවත්පත යහතින් සැරදෙත් ය!

♦ **රත්නාවලි කුමාරි දිසානායක**
Hounslow Middx UK

## මගේ පැතුම !

හැඩකාර දහකාර කෝමල සිතැත්තී
නැණ නුවන පහදලා සියල් සිත්ගත්තී
වන්නටත් පළමුවෙන් තුරුණු විය වියැත්තී
සමුගන්න හිතනවද අප ලංකා විත්තී

දෙස් විදෙස් පුවත් ගෙන ගත සරස ගන්නී
දින පොතේ පිටු තුළින් එබී හිනැහෙන්නී
ලියන්නට කතා, කවි, නිබඳ අත දෙන්නී
ගියොත් අප හැර ඔබය දුක් අපට දෙන්නී

අයුක්තිය දුටු විටදි නයෙක් ලෙස කිපෙන්නී
විදිය යුතු තැන බලා ඊතලය යවන්නී
පහර කෑවත් කොතෙක් අභීතව සිටින්නී
බිහිවුනත් නොරට ඔබ හෙළ දියණී වන්නී

අවුරුද්දෙ සිරි රැගෙන ගේ තුළට වදින්නී
සිනා කැන් ඉහිරමින් රටට සෙත් පතන්නී
හැර ගියත් අප සිතේ සදාකල් රැඳෙන්නී
ඔබට ඇති ආදරය තවම ඔබ නොදන්නී

සියලු බාධක දුරින් දුරුවී
ජය බිමක් වෙත පා නගන්නයි
වියත් ජනතා ඇසුර සැමදා
ඔබේ නිවසේ ලැගුම් ගන්නයි
සුජාතවු දියණියක් වූ ඔබ
අභීතවු දියණියක් වෙන්නයි
සිනා කැකුළක් පිපුණු මුහුණින්
පැතුම අප අතරේම ඉන්නයි!

♦ **මොරින් සී. පෙරේරා**
London W11

## දිගුකල් වාසනාවන් ලංකාවිත්ති !

කරුණා, දයා, මෙත් ගුණකඳ ඉවත නොලා
හිනැහී යොවුන් දොරකඩ මිණි කිකිණි සලා
සුකොමළ මුව කමල සැම සිත් පුබුදු කළා
මම ඔබ වැළඳගමි! ආදර පළස එළා

දන මන රැඳුණු මිසදිටු ගන අඳුර ඉරා
හිරු දුටු වසත් කුමරිය වී සෙනෙහෙ පුරා
දහසය වසක් හෙළ සුවඳක මිහිර පෙරා
නුඹ කළ මෙහෙය අමිලය දිවි තිබෙන තුරා

සිව් කොණ සිහළ පරපුර අබිමන රකි මින්
හෙළ කුල කුමරියකගේ කිතුගොස නග මින්
බාදක හෙළා දිරියේ මාවත සද මින්
පා යුග තබනු පෙරටම තුටු දිය බෙද මින්

ජන හද බැඳුණු සෙනෙහෙන් සවි ලැබ ගත්තී
තෙරුවන් බෙලෙන් සැප බල ආයුස ඇත්තී
සිත් මල සතුට මිස රුදු ගතිගුණ නැත්තී
දිගුකල් වාසනාවන් ලංකා විත්තී!

♦ **දුලාංජලී සිරිවර්ධන**
පානදුර Sri Lanka

## අනේ වාසනාවන් ලංකාවිත්ති !

දහසක් කම්කටොළු ආවද පෙර මුණට
ඒ හැම අබිබවා නොනැවත ගොස් පෙරට
ලංකාවිත්ති පිවිසෙන දහසය වසට
කළ සේවය නැගෙයි අද මහමෙර උසට

මුලු ලොව ඔබේ කාහල පණිවුඩය නැගේ
වෙන පත් රපිදෙකුට මෙය කළ නොහැක හැගේ
නැණ බල වියත්බව පා ඔබ ඉදිරි මගේ
දහසය වසක් ළෙලදුනි ජය කොඩිය වගේ

නිම කළ නොහැකි කරදර කඳු හෙල් ආදී
අවහිර අවකැපුම් ඉසි කෝ බල සෑදී
ඔබ වෙත කොතෙක් ආවත් එකි නෙක ඇදී
ඒවා විසුණු විය ජයමාවත පෑදී

මැද පිළිවෙත අනුව එය අඩු වැඩි නොකොට
හෙළ බස හෙළ වහර ලෙළවා යස රඟට
සාහිත සයුරෙ පිහිණන නයුවෙකු ලෙසට
ලංකාවිත්ති පහනකි දැල්වෙන දැයට

පුපුරා විසිරුවත් උවදුරු එක පෙළට
සපුරා නියම මඟ හෙළිකළ අප දනට
වපුරා සිහළකම ගිය දහසය වසට
මිතුරා ඔබය, ඔබ රැකගත යුතු හෙටට

විහිදා නැණ නුවණ විලසින් මනාවන්
සිහියට නගන හොඳ හොඳ කල් පනාවන්
කාහට කියන්නද? අප උව මනාවන්
ලංකා විත්ති සැමදා වාසනාවන් !

♦ **කරුණා බස්නායක**
Hampstead, London